සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department – Colombo Education Zone

දෙවන වාර ඇගයීම - 2014
இரண்டாம் தவணை மதிப்பீடு - 2014

| | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය<br>தரம் 8 | බුද්ධ ධර්මය I හා II පත්‍රය<br>புத்த சமயம் வினாத்தாள்-1-11 | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள் |

නම / විභාග අංකය : ..........................................................................

පාසල : ..........................................................................

<u>සැලකිය යුතුයි.</u>

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
* නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව 40 කි.

---

01. බෝසතාණන් වහන්සේ සතර පෙර නිමිති දැක කළකිරී මහබිනික්මන් කළේ,
    1. වෙසක් පුර පසළොස්වක පොහෝ දිනක ය.
    2. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනක ය.
    3. ඇසළ පුර පසළොස්වක පොහෝ දිනක ය.
    4. නිකිණි පුර පසළොස්වක පොහෝ දිනක ය.

02. ශාක්‍යයන් විසින් බුදුරජාණන් වහන්සේට පුද කළ ආරාමය.
    1. ජේතවනාරාමය යි.
    2. පූර්වාරාමය යි.
    3. ඉසිපතනාරාමය යි.
    4. නිග්‍රෝධාරාමය යි.

03. " සිත තැන්පත් කරගැනීමට හැක් වන්නේ සමථ භාවනා වැඩීමෙනි " මේ සඳහා නියමිත කමටහන් සංඛ්‍යාව.
    1. දහය කි.
    2. විස්ස කි.
    3. තිහ කි.
    4. හතළිහ කි.

04. බුදුරජාණන් වහන්සේට මුල් කාලයේදී වරින් වර භික්ෂූන් වහන්සේලා කීප නමක් ම උපස්ථාන කළහ. පහත දැක්වෙන භික්ෂූන් වහන්සේලා අතරින් උපස්ථායකයකු නොවූයේ,
    1. නාගසමාල තෙරණුවෝ ය.
    2. සෝපාක තෙරණුවෝ ය.
    3. නාගිත තෙරණුවෝ ය.
    4. මේඝිය තෙරණුවෝ ය.

05. සිල්වතුන් හා වැඩිහිටියන් නිතර වඳින සහ ගරු කරන අයට ලැබෙන ධර්මතා හතරක් වෙයි. ඒවා දැක්වෙන පිළිතුර සොයන්න.
    1. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය.
    2. ශ්‍රද්ධාව, ශීලය, ත්‍යාගය, ප්‍රඥාව.

06. "නැවත උපතක් නැත, මේ ජීවිතය මරණයෙන් අවසන් වේ. " යැයි සිතා කම්සුව විඳීම,

1. කාම තණ්හාව යි. 2. භව තණ්හාව යි.
3. විභව තණ්හාව යි. 4. ත්‍රිවිධ තණ්හාව යි.

07. පංචස්කන්ධය අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. රූප , වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ.
2. රූප, වේදනා, සංඛාර, සඤ්ඤා , විඤ්ඤාණ.
3. රූප, සංඛාර, සඤ්ඤා, වේදනා, විඤ්ඤාණ.
4. රූප. සඤ්ඤා, සංඛාර, වේදනා, විඤ්ඤාණ.

08. යළි යළිත් ඇස පිනවමින් ඇස මගින් ආස්වාදයක් ලැබීමට ඇති කැමැත්ත,

1. රූප තණ්හාව යි. 2. ශබ්ද තණ්හාව යි.
3. ගන්ධ තණ්හාව යි. 4. රස තණ්හාව යි.

09. " අචරිත්වා බ්‍රහ්මචරියං ......." යන ගාථාවේ අර්ථයට හානි කරන වගන්තිය තෝරන්න.

1. විනෝදය සඳහාම කාලය යොදවන්න.
2. අනලස්ව ඉගෙනීමේ කටයුතුවල යෙදෙන්න.
3. අනාගතය ගැන දැන්ම සිතීම වැදගත් නැත.
4. රැකියාවකට අවශ්‍ය මූලික සුදුසුකම් පසුව ලබා ගත හැකිය.

10. සිව් බඹ විහරණ පාදක කොටගෙන සිය චරිතය හැඩගස්වාගත් බෞද්ධ දරුවෙකුට කළ නොහැක්කක් මෙහි දක්වා ඇත. එය කුමක්ද?

1. අනුන්ගේ උස්මිටිකම් සැලකීම. 2. අනුන්ගේ දියුණුව ඉවසීම.
3. ප්‍රිය වචන කතා කිරීම. 4. දන් දීම.

11. තෙරුවන් ගුණ ඇතුලත් ගාථා තුනක් ගයමින් මහමග ගිය අයෙක් සොරුන්ගෙන් පහර කා මියගොස් දෙව්ලොව උපත ලැබිය. ඔහු කවුද?

1. මවට අකීකරුවූ පුතෙක් ය. 2. කාල සිටු පුත්‍රයා ය.
3. ජත්ත මානවකයා ය. 4. සුභ නම් තරුණයා ය.

12. පවට ඇබ්බැහි වූවෙකුට එහි ආදීනව කියා දී ඔහු එම වැරැද්දෙන් ගලවාගන්නා කල්‍යාණ මිත්‍රයා වන්නේ,

1. අත්ථක්ඛායී මිත්‍රයා ය. 2. උපකාරක මිත්‍රයා ය.
3. ආනුකම්පක මිත්‍රයා ය. 4. සමාන සුඛ දුක්ඛ මිත්‍රයා ය.

13. අකුසල චේතනාවක් ඇති වූ විට, එයට අවනත නොවී එම පාප චේතනාව මැඩ පැවැත්වීමට කටයුතු කිරීම,

1. අධම්ම චරියාව යි. 2. ධම්ම චරියාව යි.
3. විසම චරියාව යි. 4. අකුසල චරියාව යි.

14. ලොව ඇති ඕනෑම දෙයකින් නිසි ඵල ලබා යහපත උදා කරගැනීමට එය දියුණු කළ යුතුය. බුදුදහමට අනුව සිත දියුණු කරගැනීමට කළ යුත්තේ,

15. කළ යුතු දේ සිරිත් වන අතර නළ යුතු දේ විරිත් ය. බුදු දහමේ මෙය සීලය නමින් හඳුන්වයි. සිල්වතා සැපුවම තම,

1. කයත්, සිතත් සංවර කරගනියි.
2. කයත්, වචනයත් සංවර කරගනියි.
3. වචනයත්, සිතත් සංවර කරගනියි.
4. සිතත්, කයත්, වචනයත් සංවර කරගනියි.

16. දස කුසල් කය, වචනය, සිත මුල් කරගනිමින් සිදු කරගත යුතුය. වචනයෙන් සිදු කරගත හැකි කුසල් සංඛ්‍යාව,

1. දෙකකි. 2. තුනකි.
3. හතරකි. 4. පහකි.

17. සුද්ධෝදන රජතුමා සෝවාන් වූයේ,

1. මහා ධර්මපාල ජාතකයෙන් බණ ඇසීමෙනි.
2. සඳ කිඳුරු ජාතකයෙන් බණ ඇසීමෙනි.
3. '' උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ......'' යන ගාථාවෙන් බණ ඇසීමෙනි.
4. '' ධම්මං චරෙ සුචරිතං ......'' යන ගාථාවෙන් බණ ඇසීමෙනි.

18. මළ සිරුරක හිස අද්දර පොල්තෙල් පහනක් දැල්වීම අවමංගල චාරිත්‍රයකි. බෞද්ධ දාර්ශනික අර්ථය අනුව මෙයින් අදහස් කෙරෙන්නේ,

1. පැරණි චාරිත්‍රයක් ඉටු කිරීමක් පමණකි.
2. මියගිය තැනැත්තාගේ අවසන් ඉල්ලීමක් ඉටු කිරීමකි.
3. පහනක් නොදැල්වීමෙන් අසුභදායී වාතාවරණයක් ඇතිවේය යන අදහස යි.
4. ජීවිතයත් පහන වගේය යන අනිත්‍යය ස්වභාවය එළිදැක්වීම යි.

19. ලිඛිතව මෙන් ම වාචිකව ද අන් අය රැවටීම සමාජ විරෝධී ක්‍රියාවකි. පාපයකි. දඩුවම් ලැබිය හැකි වරදකි. මෙයින් වැළකිය හැක්කේ පංච ශීලයේ ..................... සිල් පදය සුරැකීමෙනි.

1. පළමුවන 2. දෙවන
3. තෙවන 4. සිව්වන

20. බුදු දහමට අනුව යම් තැනැත්තෙකු වඩාත් ආදරය කරන්නේ කාටදැයි හොඳින් සිතා බලා යෝග්‍ය පිළිතුර වෙන් කර දක්වන්න.

1. ගුරුතුමාට / ගුරුතුමියට
2. තමාට
3. අම්මාට
4. තාත්තාට

## II පත්‍රය

සැළකිය යුතුයි.

* පළමුවන ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් ද හිමි වෙයි..

---

(1.) පරිසර හිතකාමී වීමේ වැදගත්කම පැහැදිලි වන අයුරින් , ඔබ දෙවන වාරය සඳහා නිර්මාණය කරන ලද " බිත්ති පුවත්පත් " ඇගයීම ඇසුරින් අසා ඇති පහත සඳහන් සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. බිත්ති පුවත්පත සැකසීමේ අරමුණු හතරක් සඳහන් කරන්න. (ල. 4 යි)

II. මෙම කාර්යය ඉටු කිරීමට ඔබ ඇසුරු කරගත් ග්‍රන්ථ දෙකක් සඳහන් කරන්න. (ල. 4 යි)

III. ඔබ ඉදිරිපත් කළ නිර්මාණයේ තේමාව ලියා දක්වන්න. (ල. 2 යි)

IV. වෙනත් අය ඉදිරිපත් කළ නිර්මාණයන් දෙකක් නම් කරන්න. (ල. 2 යි)

V. බිත්ති පුවත්පතක් යළි සකස් කිරීමට ඔබ සිතාගත් ආකාරය විස්තර කරන්න. (ල. 4 යි)

VI. මෙම නිර්මාණයෙන් ඔබ උකහාගත් සාරය ජීවිතයට ගලපාගත හැකි ආකාරය විස්තර කරන්න. (ල. 4 යි)

(2.)

I. දිවා රෑ පින් වැඩෙන පින්කම් අතරින් දෙකක් නම් කරන්න. (ල. 2 යි)

II. " පරිසර නියමු සංවිධානය " මෙය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න. (ල. 3 යි)

III. වෘක්‍ෂලතාවන් බුදු දහමේ විශේෂ ඇගයීමකට ලක්ව ඇති බව දැක්වීමට නිදසුන් තුනක් ඉදිරිපත් කරන්න. (ල. 5 යි)

(03.)

I. බුදු දහම උගන්වන ආකාරයට ඇඳුම් භාවිත කිරීමේ අරමුණු දෙකක් ලියා දක්වන්න. (ල. 2 යි)

II. ආහාර අනුභවයේදී නොකළ යුතු ක්‍රියාවන් තුනක් ලියා දක්වන්න. (ල. 3 යි)

III. " ගිහි සමාජය ඇඳුම් භාවිතයේ දී ශිෂ්ටසම්පන්න විය යුතුය " මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ල. 5 යි)

(04.) ජරා මරණාදිය දුක් වුවත් ඒවා අපේ ජන්ම දායාද බව තේරුම් ගෙන දිරිමත්ව ජීවිතයට මුහුණ දිය යුතුය.

I. ජරා මරණාදිය දුක් වශයෙන් දැක්වෙන ආර්ය සත්‍යය නම් කරන්න. (ල. 2 යි)

II. එහි සඳහන් වන මරණ හැර තවත් දුක් තුනක් ලියා දක්වන්න. (ල. 3 යි)

III. ජරා මරණාදිය දුක් බව තේරුම් ගැනීමෙන් ඔබට අත්වන ප්‍රයෝජනය කුමක්දැයි කෙටියෙන් ලියා දක්වන්න. (ල. 5 යි)

(05.)

I. බුදුරජාණන් වහන්සේගේ ගුණ මෙනෙහි කරන භාවනාව නම් කරන්න. (ල. 2 යි)

II. මිනිස් සිත කිළිටි වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 3 යි)

III. "අප පාඩම් කරන බොහෝ දේ ඒ වේලාවට පමණක් මතකයෙහි රැඳේ. නමුත් පසුව ඒවා ආවර්ජනය කළ නොහැකිය."

(06.)

I. '' යහපත අයහපත තෝරා බේරාගෙන කටයුතු කළ යුතුය. '' මෙම අදහස දැක්වෙන ධම්මපද ගාථාව තෝරා ලියන්න. (ල. 2 යි)

II. බුදු දහමට අනුව වර්තමාන සමාජය තුළ හඹායන නිසරු දේවල් තුනක් නම් කරන්න. (ල. 3 යි)

III. බොදු දරුවෙකු ලෙස ඔබ අත්පත් කරගත යුතු සරු දේවල් පහක් සඳහන් කරන්න. (ල. 5 යි)

(07.)

I. ප්‍රාණඝාතනයෙන් වැළකීමෙන් සමාජයක් ලබන ආනිශංස දෙකක් ලියා දක්වන්න. (ල. 2 යි)

II. පස්පව්වල නිරත වීමෙන් විශ්ව සාධාරණව සිදු වන හානි තුනක් සඳහන් කරන්න. (ල. 3 යි)

III. '' පංච ශීලය සුරකින සමාජයක් බිහි කිරීමට කළ හැකි යහපත් ක්‍රියා රැසක් ඇත .'' ඒවායින් පහක් වෙන් කර ලියා දක්වන්න. (ල. 5 යි)